# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2265/25 - 2022 ජනවාරි මස 31 වැනි සඳුදා - 2022.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

#### දකුණු පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන සංශෝධිත නගර සභා ආඥාපනතේ 248 වගන්තිය ප්‍රකාරව කරනු ලබන නියමය

"අම්බලන්ගොඩ නගර සභාවට අයත් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වන මූල්‍ය අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම උදෙසා 2021.12.22 දින අම්බලන්ගොඩ නගර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද 2022 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් යෝජිත වියදම් පිළිබඳ ඇස්තමේන්තුවෙන් පුනරාවර්තන වියදම් සඳහා මුදල් වියදම් කිරීම පමණක් සිදු කිරීමටත්, කවර හෝ ප්‍රාග්ධන වියදමක් සඳහා මුදල් වැය කිරීමක් අවශ්‍ය වන්නේ නම් එය සභා සම්මතයක් මගින් සිදු කරවා ගන්නා ලෙසටත්, දකුණු පළාතේ ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ වන මම මෙයින් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිවරයා වන නීතිඥ මනිමෙල් වඩු අරුණ ප්‍රදීප් යන අය හට විධාන කරමි."

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2022 ක් වූ ජනවාරි මස 26 වැනි දින,
පහල ඩික්සන් පාරේ පිහිටි,
දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 01-0353

1A -PG 5742 — 15 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.